සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

06 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 33 S I

## ඉතිහාසය - I

කාලය පැය 1 1/2

සැලකිය යුතුයි :- • සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
• පහත සඳහන් ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා එයට යටින් ඉරක් අඳින්න.

01. මිනිසා බිහි වීමට නැඹුරුවක් සහිත ලොව බිහිවූ පැරණිම ඇවිදයාමේ හැකියාව සහිත මානවයා හඳුන්වන්නේ කුමන නමකින්ද?

i. චිම්පන්සියා  ii. ඔස්ට්‍රලොපිතිකස්  iii. නියැන්ඩතාලන්යින්  iv. ඔස්ට්‍රලොයිඩ්

02. අතීත මිනිසාගේ සංස්කෘතික දියුණුව සිදුවූ ප්‍රධාන අවධි කීයක් හඳුනාගෙන තිබේද?

i. 03  ii. 04  iii. 05  iv. 06

03. විජය කුමරු ලංකාවට පැමිණෙන විට මෙරට යක්ෂ නමින් හැඳින්වෙන ගෝත්‍රික ජන කොටසක් ජීවත් වූ බවට සඳහන් වන්නේ,

i. චූල වංශයේ ය.  ii. දීප වංශයේ ය.  iii. බෝධි වංශයේ ය.  iv. මහා වංශයේ ය.

04. දඩයම් යුගයේ ජීවත් වූ මෙරට ජනයාගේ ආහාරයක් ලෙස නොගත්තේ පහත ඒවායෙන් කුමක්ද?

i. සතුන්ගේ මස්  ii. අල වර්ග  iii. වගාකරගත් ධාන්‍ය  iv. ගොළුබෙල්ලන්

05. දඩයම් යුගයේ මිය ගිය මිනිසුන්ගේ ඇට සැකිලිවල රතුපාට ආලෝමයක් ආලේප කර ඇති බව සොයාගෙන ඇත. එසේ ආලේපකර ඇත්තේ මොනවාද?

i. රතු ගුරු ගල්  ii. රතු පොට්සෝලා පස

iii. රතුපාට සායම් වර්ගයක්  iv. ගස් වලින් ලබාගන්නා රතුපාට යුෂ

06. පණ්ඩුකාභය කුමාරයා සරණපාවාගත් කුමාරිකාවගේ නම කුමක්ද?

i. උම්මාද චිත්‍රා කුමරිය  ii. ස්වර්ණපාලී කුමරිය  iii. අනුලා දේවිය  iv. සුගලා දේවිය

07. ලංකාවේ නගරයක් අසල පළමුවරට වැවක් ඉදිකරන ලද්දේ,

i. වසභ රජතුමා  ii. ධාතුසේන රජතුමා  iii. පණ්ඩුකාභය රජතුමා  iv. දේවානම්පියතිස්ස රජතුමා

08. අනුරාධපුරයේ පිහිටා ඇති අභයගිරි දාගැබ ඉදිකරවන ලද්දේ කුමන රජතුමා විසින්ද?

i. දුටුගැමුණු රජතුමාය.  ii. දේවානම්පියතිස්ස රජතුමාය.  iii. වසභ රජතුමාය.  iv. වලගම්බා රජතුමාය.

09. ''වල්ලිපුරම් රන්පත් ඉරුව'' යන ලේඛනයේ ලියා ඇත්තේ කුමක් ගැනද?

i. සිත්තරුබිම් බුදල්නා ගැනය.  iii. ඉසිගිරිය ඇමතිවරයා විහාරයක් ඉදිකල බවය.

ii. ලම්භකරණ රජ වංශය ගැනය.  iv. මහසෙන් රජතුමා වැව් දහසක් ඉදිකළ බවය.

10. ටූමන්කාමන් රජතුමා ජීවත් වූයේ කුමන ශිෂ්ඨාචාරයේද?

i. මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේය.  iii. හොවැංහෝ ශිෂ්ටාචාරයේය

ii. ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයේය.  iv. ඊජිප්තු ශිෂ්ටාචාරයේය.

**ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා පහත සඳහන් ප්‍රකාශයන් හරිනම් ( ✓ ) ලකුණද, වැරදිනම් ( × ) ලකුණද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.**

11. ඉතිහාසය පිළිබඳ බොහෝ තොරතුරු සාහිත්‍ය මූලාශ්‍ර වලින් අපට ඉගෙනගත හැකිය. (   )

12. ක්‍රිස්තුස් වහන්සේ උප්පතිය සිදු වීමට පෙර කාලය ක්‍රිස්තු පූර්ව ලෙස හැඳින්වේ (   )

13. අප ජීවත්වන පෘතුවියේ මැද කොටස අධික උෂ්ණත්වයකින් යුක්තය. එය $600C^0$ ක උෂ්ණත්වයකින් යුක්ත වේ. (   )

14. පෘතුවියේ අභ්‍යන්තරයේ ඇති අධික උෂ්ණත්වයෙන් රත්වී දියර බවට පත්වී තිබෙන උණුසුම් පාෂාණ ''ලාවා'' නමින් හඳුන්වනු ලබයි. ( )

15. මිනිසා ගොවිතැන් කටයුතු කිරීමට නැඹුරුවීමත් සමග ගල් ආයුධ හා මෙවලම් වලින් කෘෂිකර්මික කටයුතු කළේය. ( )

**පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

16. පෘතුවියේ මුල්ම ජීවියා බිහි වූයේ ............................................ ය.

17. අතීතයේ අප්‍රිකා මහද්වීපයේ ජීවත් වූ ජන වර්ග හඳුන්වනු ලබන්නේ ............................................ ලෙසය.

18. විජය කුමරු ඇතුළු හත් සීයයක් පිරිස ............................................ නම් ජන කොටස අයත්වේ.

19. ලංකාවට බුදු දහම රැගෙන ආවේ කුමණ රාජ්‍ය සමයකද?............................................

20. ලංකාවේ වෙහෙණි සසුන ආරම්භ වන්නේ ............................................ දේවිය පැවිදි වීමෙන් පසුවයි.

(ල.20x2=40)

## II කොටස

**ප්‍රශ්න 05 ට පිළිතුරු සපයන්න.**

01. සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

i. දඹකොළ පටුන iii. මාතලේ අළුවිහාරය v. මින්නේරිය වැව

ii. මල්වතු ඔය iv. කලා වැව vi. තම්බපන්ණිය

02. පහත සඳහන් රූප සටහනට අදාලව අසන ලද ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

(අ)



i. " අ" රූපයේ දක්වෙන්නේ කුමක්ද?

ii. එම ශිෂ්ඨාචාරය බිහිවූයේ කුමන ගංගා නිම්නයේද?

iii. මෙම ශිෂ්ටාචාරයේ ජීවත්වූ ජනයා භාවිතා කරන ලද ලෝහ වර්ග 02ක් නම් කරන්න.

(ආ)



i. " ආ"රූපයේ දක්වෙන්නේ කුමක්ද?

ii. එය සාදා ඇත්තේ කුමණ ද්‍රව්‍යකින්ද?

iii. මේවා හමුවීමෙන් අනාරවණය වන්නේ අතීත ජනයා තුළ පැවති කුමන ලක්ෂණයක්ද?

03. i. දුටුගැමුණු රජතුමාගේ පියා සහ මවගේ නම් ලියන්න. ( ලකුණු 03 )

ii. අතීත මාගම් රාජ්‍යයට අයත්වූ පළාත් දෙක කවරේද? ( ලකුණු 04 )

iii. දුටුගැමුණු රජතුමා ශාසනික සේවාව විස්තර කරන්න. ( ලකුණු 05 )

04. i. ඉතිහාසය යනු කුමක්ද? ( ලකුණු 03 )

ii. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| අනු අංක | මූලාශ්‍රය | වර්ගය | කර්තෘ |
|---|---|---|---|
| 01 | මහාවංශය | | |
| 02 | පොළොන්නරුවේ ගල් විහාරය | | |

iii. ඉතිහාසය ඉගෙන ගැනීමේ ප්‍රයෝජන 5ක් ලියන්න. ( ලකුණු 05 )

05. i. ''මොසොපොතේමියා'' යන වචනයේ අදහස කුමක්ද? ( ලකුණු 03 )

ii. මෙසොපොතේමියානු සමාජය බෙදී තිබුණු කොටස් 04 නම් කරන්න. ( ලකුණු 04 )

iii. මධ්‍යශිලා යුගයේදී දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ මොනවාද? ( ලකුණු 05 )

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
# ඉතිහාසය - පිළිතුරු පත්‍රය

## 06 ශ්‍රේණිය

I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 01 | 02 | 11 | ✓ |
| 02 | 01 | 12 | ✓ |
| 03 | 04 | 13 | X |
| 04 | 01 | 14 | ✓ |
| 05 | 01 | 15 | X |
| 06 | 02 | 16 | ජලයේදීය |
| 07 | 03 | 17 | නිග්‍රොයිඩ් |
| 08 | 04 | 18 | ආර්ය |
| 09 | 03 | 19 | දේවානම්පියතිස්ස රජසමය |
| 10 | - | 20 | අනුලා |

II කොටස

01. සිතියමේ ලකුණු කර ඇත. ( ලකුණු 2x6=12) එක් ස්ථානයක් නිවැරදිව ලකුණු කර නම් කිරීමට ලකුණු 2ක් ලබා දෙන්න.

02. (අ) i. ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයේ පැවති නගරයක නටඹුන්
ii. ඉන්දු ගංගා නිම්නයේය
iii. තඹ, ලෝකඩ, ඊයම්, ටින් ( ලකුණු 2x3=6)

(ආ) i. පාහියන්ගල ගල් ගුහාවෙන් හමුවූ තැල්ලක්
ii. බෙලිකටුවකින්
iii. ආභරණ පැළදි බවයි ( ලකුණු 2x3=6)

03. i. කාවන්තිස්ස හා විහාරමහාදේවිය
( එක් නමකට ලකුණු 2යි දෙකම තිබුණම 3යි)

ii. දකුණු සහ ගිණිකොන පළාත්ය. ( එකකට ලකුණු 2යි)

iii. රුවන්වැලි සෑය ඉදිකිරීම නව මහල් පස් මහල් සත් මහල් ප්‍රාසාද ඉදිකිරීම. මිරිසවැටිය ඉදිකිරීම ඇතුළු වෙහෙර විහාර ඉදිකිරීම, සංඝයා වහන්සේලාට පූජා කිරීම.

04. i. අතීතයේ මිනිසුන් කළකී දෑ වල එකතුව ඉතිහාසය වේ ( ලකුණු 03) මෙවැනි සමාන අදහසකට ලකුණු ලබා දෙන්න.

ii. සාහිතයමය මූලාශ්‍රයකි - මහා විහාරවාසී මහනාම හිමි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයකි - පළමුවන පරාක්‍රමබාහු රජතුමා

iii. ඉතිහාසය ඉගෙන ගැනීමේ ප්‍රයෝජන මොනවාද?
- අතීතයේ කළ කී දෑ ඉගෙන ගැනීමට හැකිවීම
- අතීතය ඉතා ආඩම්බරයෙන් මතක්කර ආඩම්බර වීමට හැකිවීම
- ශ්‍රේෂ්ඨ ඉතිහාසයන් ඇතිබව දැන ගැනීමට හැකිවීම
- අතීතයේ මුතුන් මිත්තන්ගේ ජයග්‍රහණ දැන ගැනීම හැකිවීම.
- වර්තමානයේ දී අපට හමුවන ගැටලු විසදා ගැනීමට මග පෙවීමක් ලැබීම. ( ලකුණු 05 )

05. i. ''ගංගා දෙකක් මැදි වන සේ පිහිටි රට''
''දෙගම් මැදි රාජ්‍ය යැයි'' ( ලකුණු 03)

ii. මෙසපොතේමියානු සමාජයේ බෙදී තිබුනුකොටස් 04නම් කරන්න.
i. පූජකයින් ii. ඉහළ පන්තිවල අයත් වැසියන් iii. පහළ පන්තිවල අයත් වැසියන් iv. වහලුන්

iii. ගොවිතැනට අමතරව සත්ව පාලනය දක්නට ලැබීම
ලෝහ වර්ග සොයා ගැනීම හා ගල් ආයුධ වෙනුවට ලෝහ ආයුධ සකසා ගැනීම
ගම්මාන බිහිවීම